# ෆ්ලෝබෙයාර් අතින් දල්වුණ නොනිවෙන ගිනි සිළුව 'එමා බොවාරි'

නිරෝමිණී ගුණසේකර

ගුස්තාව් ෆ්ලෝබෙයාර් උපත ලැබුවේ 1821 දෙසැම්බර් 12ද රූඇන් රෝහලේ දී ය. ඔහුගේ පියා ද එකල එම රෝහලේ ම ශල්‍ය වෛද්‍යවරයෙක් වශයෙන් සේවයෙහි යෙදී සිටියේ ය. "මා වැඩුණේ සියලුම මානුෂික දුක්කම්කටොළු මැදයේ ය. එහෙත් බිත්තියක් මගින් මා මේ කම්කටොළුවලින් වෙන් කොට තබන ලදි. මං සෙල්ලම් කළේ ඇම්ෆිතියටර් නමින් හැඳින්වෙන දේශන ශාලාවක් තුළ ය." (1857 මාර්තු 30ද ලෙරොයියේ ද ෂන්ත්පි මෙණවියට ලියන ලද ලිපියක් ඇසුරිනි). 1831 - 1839 කාලය තුළ රූඇන් විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ ෆ්ලෝබෙයාර් ඔහුගේ මුල් ම ලේඛන කටයුතු වශයෙන් දක්වෙන ලිපි කිහිපයක් ලියන්නට යෙදුණි. 1840 දී ඉසස් ජිපිල විභාගයට පෙනී සිටීමෙන් අනතුරු ව ඔහු චාරිකා කිහිපයක යෙදුණි. පිරෙනේ කඳුකරය, කෝර්සිකාව මේ අතර වැදගත් වේ. ඒ චාරිකා සම්බන්ධයෙන් ඔහු 'චාරිකා විස්තර' ද ලියන ලදි. 1840 - 1843 කාලයේ පැරිසියේ පදිංචි වන ඔහු නීතිය හදාරන්නට පටන් ගනියි. පළමු විභාගයෙන් සමත් වන ඔහු, දෙවැනි විභාගය අසමර්ථ වේ. ජීවිතය පුරාවට ම පීඩා විඳි ස්නායු රෝග තත්ත්වය මුලින් ම මතු වන්නේ 1844 දී ය. ඉන් පසු ඔහු තම 'අධ්‍යයන කුටියට ම' සීමා වී කාලය ගත කරන්නට පටන් ගනියි. ඒ රූඇන්හි ක්‍රුවාසේ ප්‍රදේශයේ ය. 1843 - 1845 කාලයේ ඔහු සිය ප්‍රථම නවකතාව වන L'Education sentimentale හි ප්‍රථම පිටපතේ කටයුතු කරගෙන යයි.

1846 වසර ෆ්ලෝබෙයාර්ගේ ජීවිතයට වැදගත් වේ. ඔහුගේ පියා මිය යයි. සොයුරිය කැරොලින් මිය යයි. ෆ්ලෝබෙයාර් මව සමඟ එක් වී කැරොලින්ගේ දියණිය (කැරොලින් නම ම දරණ) හදා වඩා ගනියි. දීර්ඝකාලීන මිත්‍රත්වයකින් ඔහු හා බැඳෙන ලුවිස් කොලේ

© නිරෝමිණී ගුණසේකර
කැත්. ප්‍රූස්ත කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ෂිත හිමි, ආර්. එම්. එස්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, රොමේලා ...
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.